# සාමකාමී ජීවිතයක් උදෙසා බෝධිසත්ත්ව චර්යාවෙහි උපයෝගිතාව; සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය ආශ්‍රිත අධ්‍යයනයක්

හපුතලේ ඤාණවිසුද්ධි[1]

## හැඳින්වීම

ලෝකයේ විද්‍යමාන අනේක සාහිත්‍යය ප්‍රවර්ගයන් අතර සංස්කෘත සාහිත්‍යය ප්‍රථමාංකයෙහි ලා සැලකීම විවාදාපන්න නොවන්නේ ඒ සඳහා ප්‍රාමාණික සාධක ඉදිරිපත් කළ හැකි බැවිනි. එය ප්‍රධාන වශයෙන් වෛදික හා ලෞකික වශයෙන් දෙ කොටසකට බෙදා දක්වා ඇති අතර මධ්‍යස්ථ විචාරකයන් විසින් බෞද්ධ සංස්කෘත නමින් තවත් ප්‍රභේදයක් පෙන්වා දී ඇත. එය භාෂාවක් ලෙස හා සාහිත්‍යයක් වශයෙන් මූල සංස්කෘතයෙන් වියුක්ත ව අභිවර්ධනය වී ඇත. බෞද්ධ සංස්කෘත සාහිත්‍යය යනුවෙන් හඳුන්වනු ලබන්නේ මුල් බුදුසමයේ යම් යම් ඉගැන්වීම් පිළිබඳ නව අර්ථකථන ඉදිරිපත් කරමින් වෙන් ව වර්ධනය වූ සාම්ප්‍රදායිකයන් විසින් ගොඩනගන ලද සාහිත්‍ය කෘති අන්තර්ගත සාහිත්‍යය යි. එය සම්පූර්ණයෙන් ම ථේරවාදයෙන් වෙන් නොවූ අතර පසු කාලීන ව ථේරවාද ධර්ම සාහිත්‍යය හා එක් ව වර්ධනය වූ බැව් පෙනේ. මහායාන ධර්මය අන්තර්ගත ප්‍රධාන ධර්ම ග්‍රන්ථ නවයක් නව ධර්ම යනුවෙන් හඳුන්වනු ලැබේ වෛපුල්‍ය සූත්‍ර යනුවෙන් හඳුන්වන්නේ ද තද්ධර්ම සාහිත්‍යය යි. ඊට අයත් ඉතා ජනප්‍රිය මෙන් ම වැදගත් කොට සැලකිය හැකි සූත්‍රයක් ලෙස සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය හඳුනාගත හැකි ය. ත්‍රිවිධ යාන අතර බුද්ධයානය ස්ථාපනය කිරීමේ අධ්‍යාශයෙන් බුදුරදුන්ගේ හා බෝසත්වරුන්ගේ ශ්‍රේෂ්ඨත්වය දක්වනු ව නොයෙක් දෘෂ්ටාන්ත භාවිත කරමින් ධර්ම ප්‍රස්තුත ඉදිරිපත් කිරීම මෙහි දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයකි. මෙහි අන්තර්ගත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේ දී බෝධිසත්ත්වවාදය ස්ථාපිත කිරීම මුඛ්‍ය අරමුණ වී ඇති බව පෙනේ. මෙම අධ්‍යයනයෙන් සිදු කරන්නට යෙදුණේ එහි අන්තර්ගත බෝධිසත්ත්ව චින්තනය හා චර්යාව පිළිබඳ ඉගැන්වීම් විමර්ශනය කර එය වර්තමාන ජන සමාජයට සාමකාමී ජීවිතයක් උදෙසා උපයෝගී කරගත හැක්කේ කෙසේ දැයි විමසීම යි. මෙම අධ්‍යයනයේ දී පර්යේෂණ ගැටලුව ලෙස සද්ධර්මපුණ්ඩරීක සූත්‍රාගත ඉගැන්වීම් මගින් ප්‍රකට වන බෝසත්වරයකුගේ චින්තනය හා චර්යාවන් කෙබඳු ද? එය සාමකාමී ජීවිතයක් සඳහා උපයුක්ත කරගන්නේ කෙසේ ද? යන කරුණු කෙරෙහි සැලකිල්ල දක්වමින් සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයේ සුඛවිහාර පරිවර්තය (13) කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී. බෝධිසත්ත්ව චර්යාව පිළිබඳ තත් සූත්‍රාගත ඉගැන්වීම් හඳුනාගැනීම, නිරර්බුද, නිරවද්‍ය හා සාමකාමී ජීවිතයක් උදෙසා එකී චර්යාවන් අනුගමනයෙහි වැදගත්කම හඳුනාගැනීම අරමුණු කෙරිණි. මෙකී අරමුණු සාක්ෂාත් කර ගැනීමෙන් එදිනෙදා ජීවිතයේ පැමිණෙන ගැටලු නිරාකරණය කර ගැනීමටත් ජීවිතයේ සාමකාමීබව පවත්වා ගැනීමට හැකිවීම මෙහි වැදගත්කම වශයෙන් දැක්විය හැකි ය.

1. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, හෝමාගම, 10200, ශ්‍රී ලංකාව.
gnanavisuddhihp829@gmail.com

සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයේ ප්‍රධාන වශයෙන් සංස්කරණ තුනක් දක්නට ලැබේ. ඒ නලිනාක්ෂදත්ත (1953), පී. එල්. වෛද්‍ය (1960) හා රාමමෝහන් දාස් (1966) යන විද්වතුන් විසින් කරන ලද සංස්කරණ යි. මෙය එච්. කර්න් විද්වතුන් විසින් LOTUS SUTRA නමින් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කර ඇත. හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමියෝ (2007) එම සූත්‍රය විචාරාත්මක අධ්‍යයනයක් ද සහිත ව සිංහල භාෂාවට පරිවර්තනය කළහ. BUDDHISM FOR TODAY (1976) යන නමින් Nikkyō Niwano මෙම සූත්‍රය ආශ්‍රයෙන් කෘතියක් රචනා කොට තිබේ. The Lotus Sutra: Ideas and Values යන්න ද මෙම සූත්‍රය ආශ්‍රිත ලිපියකි. (Rubio, C., 2012. The Lotus Sutra: Ideas and Values. The Journal of Oriental Studies, 22, pp.68-81.) මෙකී සාහිත්‍යය කෙරෙහි අවධානය යොමු කිරීමේ දී බෝසත් චර්යාව හා තත් සූත්‍රාගත කරුණු පිළිබඳ හඳුනාගත හැකිමුත් එය සාමකාමී ජීවිතයක් උදෙසා අදාළ කරගත හැකි ආකාරය පිළිබඳ අවධානයක් යොමු කර තිබෙනු නො පෙනේ. ඉහතින් සාකච්ඡා කරන ලද්දේ මීට අදාළ සාහිත්‍යය විමර්ශනය යි.

**ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරන ලදී. එහි දී රැස් කරන ලද දත්ත විශ්ලේෂණය කොට අර්ථ දැක්වීම් කරනු ලැබේ. ඒ සන්ධාර විශ්ලේෂණ ක්‍රමවේදය යොදා ගැනීමෙනි. ඒ සඳහා සාහිත්‍යික මූලාශ්‍රයට අන්තර්ගත ප්‍රාථමික මූලාශ්‍රය කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරිණි. එනම් සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයේ සුඛවිහාර නම් පරිවර්තය කෙරෙහි ය. ඊට ආධාරක ලෙස ද්විතීයික මූලාශ්‍රය කෙරෙහි ද සාවධාන විය.

**ප්‍රතිඵල, සොයා ගැනීම් සහ සාකච්ඡාව**

මහායාන බුදුසමයේ මූලික සංකල්පයක් වන බෝධිසත්ත්ව සංකල්පය කෙරෙහි අවධානය යොමු කරමින් බෝසත්වරයෙකුගේ චර්යාව පිළිබඳ කරන ලද මෙම අධ්‍යයනයේ දී බෝසත් චරිතයක දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකි විය. බෝධිසත්ත්වයෙක් යනු බුද්ධත්වය පතා ඊට අදාළ ප්‍රතිපත්ති සපුරමින් ක්‍රියා කරන උත්තමයෙකි. මහායාන බුදුසමය තුළ බෝසත්වරුන් ඉතා පූජනීයත්වයෙන් මෙන් ම පච්චේක බුද්ධ හා අරහන්ත බුද්ධ යන බෝධිත්වයන්ට වඩා උසස් කොට සැලකීමට ද යොමු ව ඇත. සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයේ 13 වැනි සුඛවිහාර පරිවර්තයට අනුව ලොවට සෙත සලසනු ව කටයුතු කරන බෝසත්වරයෙකු කරුණු සතරකින් යුක්ත ආචාරශීලී උතුමෙක් වේ. එතුමන් ඉවසීමෙන් යුක්ත වේ. (ක්ෂාන්තො භවති) දමනය වූයේ දැමුණු භූමියට පත් වූයේ වෙයි. (දාන්තෝ දාන්තභූමිං අනුප්‍රාප්තෝ භවති) තැති නොගන්නේ, තැවීමට නො පත් මනසකින් යුක්ත වූයේ වෙයි. (අනුත්‍රස්තාසංත්‍රස්තමනා) ඊර්ෂ්‍යා නොකරයි. (අනභ්‍යසූයකඃ) යනුවෙන් තත් සූත්‍රයේ අන්තර්ගත වන්නේ එම මූලික කරුණු සතර යි. සුඛවිහාර පරිවර්තයට අනුව බෝධිසත්ත්වරයෙකුගේ ස්වභාවය දැක්වීමට ආචාර ගෝචර සම්පන්න යන වචනය ද භාවිත කොට තිබේ. (ආචාර-ගෝචරප්‍රතිෂ්ඨිතෙන) එයින් කියවෙන්නේ ධර්මානුකූල හැසිරීම්වලින් යුතු, සදාචාර සම්පන්න වන, තමන්ගේ විෂය කෙරෙහි හෙවත් තමන්ගේ අරමුණ කෙරෙහි සාවධාන ව සත්පුරුෂ ආශ්‍රය ප්‍රිය කරමින් කටයුතු කරන කෙනෙකු බව යි.

ඉහත දක්වන ලද ලක්ෂණ සතරට අනුගත වූ බෝසත් තෙමේ ආචාරගෝචර

සම්පන්න වූයේ එකිනෙකා සමග වාදවිවාද කිරීමෙහි නො ඇලුණේ ගැටීම් රහිත ව වාසය කරන්නේ ය. ඉවසීම ඉතා උසස් ගුණයකි. එය බුද්ධත්වය සඳහා වන පාරමිතාවක් ද වේ. එය ජීවිතය තුළ පුරුදුපුහුණු කිරීම සාමකාමීබව පවත්වා ගැනීමට මහෝපකාරී වේ. සංවරබව, උදාසීන මානසිකත්වයෙන් බැහැර ව ප්‍රබෝධවත් මනසකින් යුක්ත වීම, ඊර්ෂ්‍යා නොකිරීම ආදි ගුණාංගවලින් යුක්ත වීම ද ඕනෑම සමාජ සංස්ථාවක් තුළ ජීවත් වීමේ  දී ගැටුම්වලින් තොරව, නිදහස් මනසකින් යුක්ත ව සුවපහසුවෙන් ජීවත් විය හැකි වෙයි.

"වාරමුඛ්‍යා න සේවෙත යෙ චාන්‍යෙ භොගවෘත්තිනඃ

ප්‍රතිසංමෝදනං තෙභිඃ සර්වශඃ පරිවර්ජයේත්" (12 ශ්ලෝකය.)

බෝධිසත්ත්වයෙකුගේ චර්යාව පිළිබඳ සඳහන් උද්ධෘතයකි ඉහත දක්වන ලද්දේ. එයින් කියැවෙන්නේ බෝධිසත්ත්වයෙක් වෛශ්‍යාවන් ද යම්බඳු වූ වෙනත් දුශ්චරිතවත් පුද්ගලයන් ද ඇසුරු නො කරන බව යි. ඔවුන් සමග සතුටු වීම් සියලු ආකාරයෙන් ම දුරු කරන බව යි.

බෝසත් චර්යාව තුළ දැකිය හැකි තවත් ලක්ෂණ කිහිපයක් මෙහි දී හඳුනාගත හැකි විය. එනම්, නො සුදුසු පුද්ගලයන් ඇසුරු නො කිරීම, එවැනි ස්ථානවලට නොයෑම, අවශ්‍ය දේ පමණක් කථා කිරීම, අන් අයට නින්දා නො කිරීම, අගුණ නොකීම යනාදිය යි. ජීවිතය තුළ සාමකාමීබව වර්ධනය කර ගැනීමට නම් ආකල්ප හා චර්යා රටාව යහපත් ආකාරයෙන් පවත්වා ගත යුතු වෙයි. එකිනෙකා වටහා ගෙන අර්බුද වළක්වා ගැනීම පිණිස ක්‍රියා කළ යුතු ය. ජීවත් වීමේ දී විවිධ අභියෝගවලට මුහුණ දීමට සිදු වන අතර නිරර්බුද, සාමකාමී ජීවිතයක් ගත කිරීමට නම් ගුණාත්මක ආකල්ප හා යහපත් චර්යා රටාවකින් කටයුතු කිරීම අත්‍යවශ්‍ය සාධකයකි. බෝසත්වරයෙකුගේ ජීවත් වීමේ රටාව පිළිබඳ කියවෙන සුඛවිහාර පරිවර්තය අධ්‍යයනයෙන් හා ඒවා ප්‍රායෝගික ව භාවිත කිරීමෙන් එවන් සාමකාමී ජීවිතයකට මඟ විවර වේ. බෝධිසත්ත්වයන් වහන්සේලා සිත, කය, වචන යන ත්‍රිවිධ ද්වාරයන් සංයමයෙන් යුතු ව පවත්වා ගන්නා ආකාරය හා සුඛවිහරණයෙන් යුක්ත ව වාසය කරන ආකාරය ඉතා පැහැදිලි ව පෙන්වා දී ඇති ආකාරය එම ඉගැන්වීම් කෙරෙහි සාවධාන වීමෙන් අවබෝධ කර ගත හැකි ය.

**නිගමනය**

මහායාන බුදුසමයාගත බෝධිසත්ත්ව චින්තනය හා චර්යාව පිළිබඳ සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයේ සුඛවිහාර පරිවර්තය ආශ්‍රය කර ගනිමින් සිදු කරන්නට යෙදුණු මෙම අධ්‍යයනයේ ප්‍රතිඵලවලට සහ නිරීක්ෂණය කරන ලද කරුණු කෙරෙහි සාවධාන වීමේ දී බෝධිසත්ත්ව චර්යාව අතිශය පාරිශුද්ධ වූ ආකල්ප හා ක්‍රියාපිළිවෙත් සමග ඒකාබද්ධ වූවක් බැව් පැහැදිලි වේ. ඒ අනුව වර්තමාන ජනසමාජයට සාමකාමී හා සුඛදායී ජීවිතයක් ගත කිරීම පිණිස එහි පෙන්වා දෙන බෝසත් චරිතය පිළිබඳ ඉගැන්වීම් උපයෝගී කර ගත හැකි බැව් මෙමගින් එළැඹි නිගමනය යි.

**මුඛ්‍ය පද:** නව ධර්ම, බෝධිසත්ත්ව චර්යාව, බෞද්ධ සංස්කෘත, මහායාන, සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය

## ආශ්‍රිත ග්‍රන්ථ

පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ. (2007). *සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය*. 2nd ed. කොළඹ 10: සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Dutt, Dr. N. (1953). *SADDHARMAPUṆḌARĪŒŪTRAM*. 1st ed. Calcutta: The Asiatic Society.

Niwano, N. (1976). *BUDDHISM FOR TODAY*. Tokyo: Kosei Publishing Company.

Vaidya, Dr. P. L. (1960). *SADDHARMAPUṆḌARĪŒŪTRA*. 1st ed. Darbhanga: The Mithila Institute.

Wikipedia contributors (2018). Wikipedia, the Free Encyclopedia. [online] Wikipedia. Available at: https://en.wikipedia.org/wiki/Main_Page.